**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු විදුලි ගාස්තු, දුරකථන ගාස්තු, ජල ගාස්තු සහ වෙනත් ගෙවීම් ඇතුළුව එකතුව රු. 1,277,526 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ගිණුම් වාර්තා සකස් කරන අවස්ථාව දක්වා ලැබුණු සියලුම ගෙවීම් පත්‍රිකා ඇතුළත් කර ගිණුම් සකස් කර ඇති බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | වසර දෙකකට වැඩි කාලයක් කල් ඉකුත් වූ රු. 1,462,860 වටිනාකමින් යුත් තැන්පතු 04 ක් සම්බන්ධයෙන් ඒවා අදාළ පුද්ගලයන් වෙත ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | පළමු, දෙවන සහ තුන්වන නිවේදන අදාළ පුද්ගලයින්ට නිකුත් කර පිළිතුරු ලැබීමෙන් පසු සම්පූර්ණ කරන බව. | මුදල් රෙගුලාසි අනුව, වසර දෙකකට වඩා කල් ඉකුත් වූ තැන්පතු අදාළ පුද්ගලයන්ට ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරුකිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 12,533,099 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු. 3,380,923 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂය තුළ අගරු කරන ලද රු. 100,240 ක් වටිනා චෙක්පත සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් මුදල් පොතේ අවශ්‍ය ගැලපීම් සිදු කර සත්‍ය මුදල් ශේෂය සොයා ගැනීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බැංකුව විසින් අගරු කරන ලද මෙම චෙක්පත තවමත් බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති බව. | මුදල් පොතේ අවශ්‍ය ගැලපීම් සිදු කර සත්‍ය මුදල් ශේෂය සොයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර හතරකට වඩා ජංගම ගිණුම් 03 ක රු. 3,960,887 ක ශේෂ පැවතුණි. තවදුරටත්, 2018 සිට 2023 වසර අවසානය දක්වා බැංකු ජංගම ගිණුම් ශේෂ ලෙස රු. 17,705,923 ක් පැවතුන ද, සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සිදු කිරීමට අවශ්‍ය මුදල් හැර අතිරික්ත මුදල් සභාවට ආදායම් ලබාගත හැකි මූලාශ්‍රවලට යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් උපරිම කරන මූලාශ්‍රවල ආයෝජනය කිරීමට පියවර ගන්නා බව. | අතිරික්ත අරමුදල් සභාවේ අරමුණු ළඟා කර ගැනීමට හැකි වන ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | 6,000 | - | - | - |
| (ii) | කුලී | 4,895,000 | 5,443,021 | 5134430 | 4,066,628 | 2,565,000 | 6,736,598 | 3,467,415 | 3,269,183 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 689,000 | 826,990 | 826,990 | - | 810,000 | 505,225 | 505,225 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,262,000 | 3,220,440 | 3,107,850 | 171,937 | 3,758,000 | 2,895,269 | 2,895,269 | - |
| (v) | එකතුව | 8,846,000 | 9,490,451 | 9,069,270 | 4,238,565 | 7,139,000 | 10,137,092 | 6,867,909 | 3,269,183 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කුලිය රු. 1,948,123 ක් වූ අතර, මෙම මුදල දීර්ඝ කාලීන පදනම මත කුලියට ලබාගත් පුද්ගලයන්ගෙන් අයවිය යුතු වන අතර ඔවුන්ගෙන් පසුගිය වසරේ හිඟ අයනොවී සමාලෝචිත වර්ෂයේදී රු. 488,853 කින් හිඟය වැඩි වී පැවතුණි. | 2024 වන විට අයකිරීමට හෝ නීතිමය ක්‍රියා මාර්ග ගනු ලබන බව. | අයකරගත යුතු හිඟ ආදායම් ඉතා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 1,436,450 මුද්දර ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉල්ලා ඇති ලේඛන ලැබුණු වහාම පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කරන බව. | කාලය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තම්බිලුවිල් පොදු වෙළෙඳ පොළ ගොඩනැඟිල්ලේ ඇති කඩ කාමර 06 ක් සහ පැරණි කඩ කාමරයක් කුලියට දීමට වසර 04 කට වඩා වැඩි කාලයක් සභාව කටයුතු කර නොතිබුණි. | වීදි කඩවලින් සහ ජංගම රථවලින් ජනතාව භාණ්ඩ මිලදී ගන්නා නිසාත් කඩකාමර කුලියට ලබාගැනීමට වෙළෙඳුන් ඉදිරිපත් නොවන බව. | කඩ කාමර කුලියට දීමට පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ භාවිතා කරන කසළ ග්‍රේඩරය සහ කඩදාසි සකසන යන්ත්‍ර දෙකක් වසර ගණනාවක් නඩත්තුවකින් තොරව අබලන්ව ඇති අතර අලුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට හෝ කුලියට දීමට සභාව කටයුතු කර නොතිබුණි. | අදාළ යන්ත්‍ර භාවිතයට සුදුසු පරිදි අලුත්වැඩියා කිරීමට දැනට පියවර ගෙන ඇති බව | අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ කුලියට ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ පවතින වාහන 09 සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 17,678,131 ක මුදලකට මිලදී ගෙන තිබුණු වී පිරිසිදු කිරීමේ සහ වී වියළන යන්ත්‍ර භාවිතයට අවශ්‍ය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාව විසින් රු. මිලියන 10.6 ක මුදලක් ඇස්තමේන්තු කර වෙන්කිරීම් කර තිබුණද, මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නොකර අදාළ යන්ත්‍ර භාවිතා නොකර නිෂ්කාර්යව පවතින අතර යන්ත්‍රවල වගකීම් කාලයද අවසන් වීමට ආසන්නව පැවතුණි. | සුදුසු පිළිතුරක් ලබා දී නැත. | ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය සහ මියගිය සේවකයන් 05 දෙනෙකුගේ රු. 316,792 ක් අය නොවී දිගින් දිගටම මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මරණ පාරිතෝෂිත විශ්‍රාම පාරිතෝෂිකය ලැබෙන විට එයින් අදාළ මුදල් අයකරගනු ලබන බව | අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුගෙන් කඩිනමින් අය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලියාපදිංචි ආයතන 13 ක බලපත්‍ර කල් ඉකුත් වී ඇතත්, ඒවා අලුත් කිරීමට කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | ඉදිරියේදී කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කර ගැනීමටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරනු ලබන බව. | පනත අනුව, බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |